**ශීර්ෂය 317 – උතුරු මැද පළාත් සභාව පිළිබඳ විගණකාධිපති වාර්තාව 2017 වර්ෂය**

---

**1. දැක්ම, මෙහෙවර හා කාර්යභාරය**

**1.1 දැක්ම**

පිරිපුන් පළාතක්.

**1.2 මෙහෙවර**

ධරණීය සමමිතික සන සාර්ව සංවර්ධන ප්‍රවේශයකින් පළාත් සංවර්ධනය ප්‍රමුඛ කර ගත් ජාතික සංවර්ධනයට සෘජු හා අඛණ්ඩ ලෙස දායකවීම.

**1.3 කාර්යභාරය**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ දහතුන්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයේ හා 1987 අංක 42 දරන පළාත් සභා පනතේ විධිවිධාන පරිදි කාර්යයන් හා කර්තව්‍යයන් ඉටු කිරීම.

**2. විසර්ජන ගිණුම**

**මුළු ප්‍රතිපාදනය හා වියදම්**

උතුරු මැද පළාත් සභාව සඳහා සලසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනය රු. මිලියන 18,329.08 ක් වූ අතර සමාලෝචිත වර්ෂය අවසාන වන විට ඉන් රු.මිලියන 17,124.85 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව පළාත් සභාව වෙත සලසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනයෙන් රු.මිලියන 1,204.23 ක් හෙවත් සියයට 6.57 ක ප්‍රතිපාදන ඉතිරි වී තිබුණි. විස්තර පහත දැක්වේ.

| වියදම | 2017 දෙසැම්බර් 31 දිනට | | | ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|
| | ශුද්ධ ප්‍රතිපාදනය | උපයෝජනය | ඉතිරිය | |
| | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | |
| පුනරාවර්තන | 13,828.65 | 13,828.65 | - | |
| මූලධන | 4,500.43 | 3,296.20 | 1,204.23 | 26.76 |
| **එකතුව** | **18,329.08** | **17,124.85** | **1,204.23** | **6.57** |

**3. විගණන නිරීක්ෂණය**

ශීර්ෂය යටතේ පාර්ලිමේන්තුව විසින් සලසා තිබුණු ප්‍රතිපාදන පළාත් සභාව විසින් පළාත් සභාවේ අරමුදල යටතේ ගිණුම්ගත කර උපයෝජනයන් සිදු කර තිබුණි. පළාත් සභාවේ අරමුදල විගණනය කර ඒ පිළිබඳ විගණකාධිපති වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.